# මිරිදිය කර්මාන්තයේ බාධක කිහිපයක්

ශ්‍රී ලංකාවේ මිරිදිය ධීවර කර්මාන්තය දෙස බැලීමේදී පසුගිය දශකය තුලදී එය බෙහෙවින්ම වර්ධනය වී ඇති බව පෙනේ. විශේෂයෙන්ම පසුගිය කාලය තුලදී රජය මගින් දියත් කරනු ලැබූ ධීවර මහා සැලැස්ම (1979–83) මගින් මිරිදිය ධීවර කර්මාන්තය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ලැබිය එමගින් මේ අංශයෙහි සහනාධාර යාත්‍රා හා අනෙකුත් ආම්පන්න සඳහාත්, මසුන් වඩ වඩාත් බෝ කර ව්‍යාප්ත කිරීම සඳහාත්, පර්යේෂණ කටයුතු සඳහාත්, විශාල පරිශ්‍රමයක් දරනු ලැබූ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් සෑහෙන ප්‍රගතියක් අත්කර ගැනීමට හැකිවී තිබේ. 1978–1983 අතර කාලය තුලදී මෙ.ටොන් 16,400 සිට මෙ.ටොන් 35,500 දක්වා එනම් 116%කින් මිරිදිය මාළු නිෂ්පාදනය වැඩිවී ඇත. 1983 දී නිපදවූ මිරිදිය මාළු ප්‍රමාණය රටෙහි සම්පූර්ණ මාළු නිෂ්පාදිත යෙන් 16.2% කට සමාන ප්‍රමාණයක් විය.


පර්යේෂණ හා පුහුණුකිරීමේ නිලධාරි

**ජේ. කේ. ඇම්. ඩී. චන්ද්‍රසිරි**

**විසිනි**


මෙරටෙහි අභ්‍යන්තර ජලාශ හා ජල සම්පත් පිළිබඳව සැලකිලිමත් වීමේදී අද පවත්නා තත්ත්වයට වඩා මිරිදිය ධීවර කර්මාන්තය දියුණු අඩියකට ගෙන ඒමෙහි ලා සුදුසු වාතාවරණයක් පවතී. විශේෂයෙන්ම ආදි කාලයේ සිට පැවති විවිධ ප්‍රමාණයේ වැව් සහ ජලාශයනුත්, මෑත කාලයේදී වාරිමාර්ග යෝජනා ක්‍රමයන් යටතේ නිර්මාණය කරන ලද ජලාශයනුත් ගෙන බලන විට ඒවා විශාල බිම් ප්‍රදේශයක් වසා පැතිරී පවත්නා බව පෙනේ (පළවැනි සටහන බලන්න). මීට අමතරව මධ්‍යම කඳුකරයේ සිට සෑම පැත්තකටම ගලා යන ඇල, දොළ, ගංගා ආදී ජල සම්පත්ද මිරිදිය ධීවර කර්මාන්තය දියුණු කිරීම සඳහා බෙහෙවින්ම ප්‍රයෝජනයට ගත හැකිය.

පළවෙනි සටහන

අභ්‍යන්තර ජලාශයන්හි අක්කර ප්‍රමාණය

| ජලාශයන්හි ස්වභාවය | අක්කර ප්‍රමාණය |
|---|---|
| ප්‍රධාන වාරිමාර්ග | ... 1,75,000 |
| මධ්‍යම ප්‍රමාණයේ වාරිමාර්ග | ... 42,000 |
| කුඩා වාරිමාර්ග | ... 97,000 |
| මහවැලි ව්‍යාපාරය යටතේ ඇති ජලාශ | ... 60,000 |
| උඩරට ප්‍රදේශවල ජලාශ | ... 20,000 |
| විල් සහ විල්ලු | ... 10,000 |
| කරදිය ජලාශ | ... 3,00,000 |
| එකතුව | ... 7,04,000 |

මූලාශ්‍රය : ආර්ථික විමසුම, 9 වෙනි වෙළුම, අංක 3, 1983 ජුනි

මෙරට මිරිදිය ධීවර කර්මාන්තය දියුණු කිරීමෙන් අත්කර ගත හැකි වාසි ඉමහත්ය. ආර්ථික කටයුත්තක් වශයෙන් එය දියුණු අඩියකට ගෙන ඒම තුලින් මෙරට සෑහෙන පිරිසකට ඒ ඇසුරින් රැකියා අවස්ථා සඳහා මග සලසා ගත හැකිය. දැනටමත් මෙය දියුණු තත්ත්වයක පවතින බොහෝ ජලාශයන්හි සැලකිය යුතු පිරිසක් මේ මගින් ජීවිකා වෘත්තිය සලසා ගෙන තිබේ. මසුන් අල්ලන්නන් වශයෙන් පමණක් නොව මේ නිසා ආම්පන්න හා අනෙකුත් උපකරණ සපයන්නන්, වෙළඳුන් හා වෙනත් සේවා සපයන්නන් වශයෙන් අමතර පිරිසකටද රැකියා පහසුකම් සැලැසේ.

වාරිමාර්ග හා ජනපද ව්‍යාපාරයන්හි ප්‍රධාන ප්‍රශ්නයක් බවට පත්වී ඇති මුල් පදිංචි කරුවන්ගෙන් පැවතෙන දෙවන හා ඊළඟ පරම්පරාවන්හි සාමාජිකයන්ට ඉඩම් හා රැකියා නොමැතිකම පිළිබඳ ප්‍රශ්නයටද මෙය යම් තරමකින් හෝ විසඳුමක් වනු නොඅනුමාන ය. ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය මගින් මිරිදිය ධීවර කර්මාන්තය පිළිබඳව මෑතකදී කරන ලද පර්යේෂණයකට අනුව රිදියගම

හා බදගිරිය වැනි පැරණි ජනපද ව්‍යාපාරවල මුල් පදිංචි කරුවන්ගේ දෙවැනි පරම්පරාවේ සාමාජිකයන් විශාල ප්‍රමාණයක් තමන්ට අත්දැකීමට සිදුවූ විරැකියාව පිළිබඳ ප්‍රශ්නයට මුහුන දී තිබුනේ එම ජනපදයන්ට ජලය සැපයූ ජලාශයෙහි ධීවර කර්මාන්තයෙහි නියුතු වීමෙනි. කෘෂිකාර්මික හා ගොවිජනපද පිහිටුවීම වේගවත්ව සිදුවූ මෑත භාගයේදී අළුත් ජලාශ විශාල ප්‍රමාණයක් ඉදිකරනු ලැබූ අතර ඒවා යටතේ ගොවි පවුල් දහස් ගණනින් පදිංචි කරවනු ලැබූහ. එනිසා එම ජලාශයන්හිද ධීවර කර්මාන්තය දියුණු කිරීම ඒවා යටතේ ඇති අළුත් ජනාවාසයන්හි පැන නගින ආර්ථික ප්‍රශ්න වලට යම් තරමකින් හෝ පිළියමක් වනු නිසැකය.

මිරිදිය ධීවර කර්මාන්තය දියුණු කිරීමෙන් පූර්ණ කාලීන රැකියා මාර්ගයන්ට අමතරව කාලීන වශයෙන් සේවා නියුක්ත වීමටද බොහෝ පිරිසකට මග සැලසේ. විශේෂයෙන්ම කෘෂිකාර්මික යෝජනා ක්‍රමයන්හි මූලික කටයුත්ත වී ගොවිතැන නිසා වී වැපිරීමෙන් පසුව ගොවීන්ට බොහෝ කාලයක් යනතෙක් එතරම් බරපතල කටයුතු නොමැති නිසා නිකරුනේ කාලය ගත කිරීමට සිදුවේ. මේ කාලයේදී ඔවුන්ට ධීවර කර්මාන්තයෙහි යෙදීමට හැකිනම් අමතර ආදයමක් උපයාගත හැක. විශේෂයෙන්ම කෘෂිකාර්මික කම්කරුවන්ට සහ අනෙකුත් කුලී ශ්‍රමිකයන්ට සෑම කාලයක දීම රැකියා සපයා ගැන්ම අපහසු නිසා සේවාවන් නොමැති අවස්ථා වලදී මෙහි නිරත වීමට හැකිය. කෘෂි කාර්මික කටයුතු හැම විටම අවදනමට ලක් වීමට ඇති හැකියාව වැඩි අතර එවැනි අවස්ථාවන්හිදී තමන්ට මුහුණ දීමට වන පීඩාකාරී බවින් මිදීම සඳහා ගොවීන්ට විකල්ප මාර්ග තිබිය යුතුය. මිරිදිය ධීවර කර්මාන්තය වුවද එවැනි විකල්ප මාර්ගයක් හැටියට යොද ගත හැක. මීට අමතරව කෘෂිකාර්මික සමාජයක පදිංචිකයන්ගේ පවුල් වලට අමතර ආදයම් ගෙන දෙන මාර්ගයක් වශයෙන් සහ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා උපයෝගී කරගත හැකි කටයුත්තක් ලෙස මෙහි වැදගත්කමක් පවතී.

මිරිදිය ධීවර කර්මාන්තය දියුණු කිරීමේ අනෙක් වැදගත්ම කරුණ වන්නේ මෙරට ග්‍රාමීය ප්‍රදේශවල ප්‍රධාන ප්‍රශ්නයක් බවට පත්ව ඇති මන්දපෝෂණය දුරලීම සඳහා එය ඉවහල් කරගත හැකි වීමයි.



මිරිදිය මසුන් අල්ලන අවස්ථාවක්

මෙරට දරුවන්ගෙන් 34%ක් පමණ බරපතල ලෙස මන්දපෝෂණයෙන් පෙළේ. මෙය දුරලීම සඳහා මාළු වැනි වඩාත් පෝෂ්‍යදයක ආහාර ලබාදිය යුතු අතර දිවයිනේ අභ්‍යන්තරයට යත්ම ප්‍රවාහන අපහසුකම් නිසා මුහුදු මාළු ලබා ගැනීමට නොහැකිය. තිබුනද මිළ ඉතා ඉහළ වේ. මේ නිසා ගම්බද ජනතාවට අඩු මුදලට ඇති තරම් මාළු ලබා දිය හැකි හොඳම උපක්‍රමය මිරිදිය ධීවර කර්මාන්තය දියුණු කිරීම හැටියට බොහෝ දෙනෙක් පිළිගෙන තිබේ. මුහුදු මාළු මෙන් නොව මිරිදිය මාළු සඳහා වැයවන නිෂ්පාදන පිරිවැය ඉතාම අඩුනිසා වඩාත් දුප්පත් අයට ඉතා අඩු මුදලකට මේවා ලබා ගැනීමට සැලසිය හැක.

මේ අංශය දියුණු කිරීම සඳහා අවධානය යෙදිය යුතු අනෙක් වැදගත්ම කාරණය වන්නේ ධීවර මහා සැලැස්ම : 1979–1983 අනුව 1983 වන විට කරදිය ධීවර කර්මාන්තයේ වෙරළබඩ තීරයෙන් (ගොඩබිම සිට සැ. 25 ක් දක්වා විහිදෙන ප්‍රදේශය) ලබාගත හැකි සම්පත් උපරිම ලෙස ප්‍රයෝජනයට ගෙන අවසන් වීමයි. ඒනිසා තව දුරටත් කරදිය ධීවර කර්මාන්තය දියුණු කරන්නේ නම් වෙරළබඩ තීරයෙන් එපිට ප්‍රදේශයේ හා ගැඹුරු මුහුදෙහි සම්පත් කෙරෙහි අවධානය යොමු කිරීමට සිදුවේ. නමුත් ඒ සඳහා ආම්පන්න, යාත්‍රා හා අනෙකුත් දේවල් සඳහා විශාල වියදමක් වැයවෙන බැවින් නිෂ්පාදන වියදම අනුව මාළු රාත්තලක් සාමාන්‍ය අයෙකුට දැරිය නොහැකි තරම් ඉහල මිලක් වනු ඇත. එනිසා මාළු නිෂ්පාදනය වැඩි කිරීම සඳහා පහසුම මාර්ගය මිරිදිය අංශය දියු ණුකිරීම බව පිළිගෙන ඇත.

මෙරට ජලාශයන්ගෙන් බොහොමයක් තවම ප්‍රධාන වශයෙන් යොද ගැනෙන්නේ කෘෂිකර්මය සඳහා ජලය සැපයීමට පමණක් වන අතර ඒ ආශ්‍රයෙන් ධීවර කර්මාන්තය වැන්නක් දියුණු කිරීම සඳහා එතරම් උත්සාහයක් දරා නොමැත. එහෙත් මිරිදිය ධීවර කර්මාන්තය ආර්ථික කටයුත්තක් වශයෙන් වඩාත් දියුණු කිරීමේදී ගැටළු ගණනාවකට මුහුණ දීමට සිදුවන අතර ඒවා පිළිබඳව වඩාත් පුළුල් අන්දමින් සාකච්ඡා කිරීමට මෙහිදී බලාපොරොත්තු වෙමි.

වාරිමාර්ග කටයුතු සඳහා යොද ගනු ලබන ජලාශ යන්හි ධීවර කර්මාන්තය දියුණු කිරීම සඳහා කටයුතු කිරීමේදී පැන නගිනු ලබන පරිපාලනමය බාධක කෙරෙහි ප්‍රථමයෙන්ම අවධානය යොමු විය යුතුය. මෙම ජලාශ වාරි ජලය සැපයීමේ අරමුණ ඇතිව ඉදිකල ඒවා බැවින් ඒවායේ පරිපාලනය වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ පවතී. එහෙත් ධීවර සම්පත් දියුණු කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන ධීවර අමාත්‍යාංශය වැන්නකට අවශ්‍ය තොටුපලවල් දෙපාර්තමේන්තුව යටතේ පවතී. එහෙත් ධීවර සම්පත් දියුණු කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන ධීවර අමාත්‍යාංශය වැන්නකට අවශ්‍ය තොටුපලවල් පිහිටුවීම ආදී ක්‍රියාමාර්ග ගනිමින් මෙම ජලාශ වල කටයු තු කිරීමට නිත්‍යානුකූලව බලය පැවරී නොමැත.

අළුතින් බිහිකර ඇති ජලාශයෙන් බොහොමයක් වනාන්තර බිම් වසා පැතිරෙන නිසා මෙම ජලාශයන්හි දිරාගිය ගස් වල කොටස් ඇති නිසා මිරිදිය ධීවර කර්මාන්තයෙහි යෙදෙන්නන්ට බොහෝ ගැටළුවලට මුහුණ දීමට සිදුවේ. විශේෂයෙන්ම ඔවුන්ගේ දැල් හා ඔරු මෙම කොටවල පැටලීම හා හැපීම නිසා ඒවා කැඩී බිඳී යයි. මෙම ගස් මුල් ඉවත් කර භෞතික පරිසරය සකස් කිරීම මේ සඳහා ඇති විසඳුම වුවත් ධීවර අමාත්‍යාංශය වැන්නකට ඒ සඳහා නීතිමය බලයක් නොමැති බැවින් එවැනි පියවර ගැනීමට අවහිරයක්ව පවතී.

ඇතැම් දේශගුණික සාධකයන්ද මිරිදිය ධීවර කර්මාන්තය දියුණු කිරීමෙහි ලා ගැටළු වශයෙන් පැනනගී. විශේෂයෙන්ම වියලි කලාපයෙහි වර්ෂා පතනයෙහි පැතිරීම අනුව එක් කාලයකට අඩුවෙන් ජලය ලැබීම හෝ ඇතැම් විට කොහෙත්ම ජලය නොලැබීම නිසා ජලාශයන්හි ජල මට්ටම බෙහෙවින්ම අඩුවීයාම එසේත් නැත්නම් ඇතැම් ජලාශ මුළුමනින්ම සිඳීයාමේ තර්ජනයට මුහුණ දෙයි. බොහොමයක් කුඩා වාරිමාර්ග සහ ගම් වැව් සම්බන්ධයෙන් මෙය පැහැදිලිවම දක්නට ලැබෙන ලක්ෂණයකි. මෙසේ ජල මට්ටමෙහි අඩුවැඩිවීම ධීවර කර්මාන්තයේ දියුණුවට බලපාන ප්‍රධාන ගැටළුවකි. ජලාශවල මත්ස්‍ය සම්පත් සම්පූර්ණයෙන්ම ක්ෂය වීමට එය හේතුවෙයි.

ජලාශයන්හි ජල මට්ටම පිළිබඳ තත්ත්වය එක්තරා ආකාරයකින් සමාජ විද්‍යාත්මක ප්‍රශ්නයක් බවටද පත්ව තිබේ. වාරිමාර්ග යටතෙහි වී ගොවිතැනෙහි නිරතව සිටින ගොවීන් තමන් ජලය ලබා ගන්නා ජලාශයෙහි ජලය සැමද පිරී තිබෙනු දක්නට කැමතිය. එමගින් තමන්ට අවදනම් තත්ත්වයකට මුහු ණ දීමේ හැකියාව අඩුය යන හැඟීමක් ඔවුන් තුල ඇතිවෙයි. එහෙත් ජලාශයන්හි ජල මට්ටම අඩුවූ විට මසුන්



මසුන් අස්වැන්නක්

ඇල්ලීම පහසු නිසා ධීවරයෝ ජලාශයෙහි අඩු ජල ප්‍රමාණයක් තිබෙනු දැකීමට කැමතිය. එනිසා ඔව්හු ජලය මුදා හැරීමට පෙළඹෙති. කෙසේ වෙතත් මෙය ස්වාභාවික කරුණක් නොවන අතර මිනිස් හැසිරීම තුලින් ඇතිවූ ගැටළුවකි. එකිනෙකට වෙනස් කටයුතු වල යෙදී සිටින දෙපිරිසක් අතර උද්ගතවී ඇති මෙම ගැටළුව වියලි කලාපයේ බොහොමයක් ජලාශ වල දක්නට ලැබෙන ප්‍රශ්නයකි.

මිරිදිය ධීවර කර්මාන්තයේදී මුහුණ දීමට සිදුවන ප්‍රධාන ගැටළුවක් නම් අල්ලන මසුන් සඳහා හොඳ වෙළඳපලක් සොයා ගැනීමේ අපහසු කමයි. මුහුදු මාළු හා සසඳා බලන විට වැව් මාළු වලට මිනිසුන් තුල ඇත්තේ අඩු කැමැත්තක් හා ඉල්ලුමකි. විශේෂ යෙන්ම මෙය බරපතල ප්‍රශ්නයක් බවට පත්ව ඇත්තේ සුලභව මුහුදු මාළු ලැබෙන ප්‍රදේශ වලට හෝ මුහුදට ආසන්නව පිහිටි ජලාශ වලින් අල්ලනු ලබන මසුන් සඳහාය. ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් හම්බන්තොට දිස්ත්‍රික්කයේ ජලාශ පහක මිරිදිය ධීවර කාර්මිකයන් පිළිබඳව කරන ලද සමාජ ආර්ථික පර්යේෂණයකින් මෙය මනාව පැහැදිලි විය. මෙම ජලාශ වෙරළේ සිට සැ. 5 ක් පමණ ඈතින් පිහිටා තිබුණි. හම්බන්තොට, අම්බලන්තොට වැනි නගරවල මුහුදු මාළු ඕනෑ තරම් තිබෙන බැවින් ඒවායේ වැව් මාළු සඳහා එතරම් හොඳ ඉල්ලුමක් නොතිබුණි.

මේ නිසා ප්‍රදේශයේ මසුන් ඒ සඳහා තරමක හෝ හොඳ ඉල්ලුමක් පැවති සැ. 20 කටත් වඩා ඈතින් වූ ග්‍රාමීය ප්‍රදේශ වලට අලෙවිය සඳහා ගෙන යාමට සිදුවූ අතර එය කරන ලද්දේ ප්‍රදේශයේ වෙළඳාම සම්බන්ධයෙන් ඒකාධිකාරිය පිහිටුවා ගෙන සිටි වෙළඳුන් විසිනි. මේ නිසා ධීවරයින් වෙළඳුන්ගේ අතකොළු බවට පත්වූ අතර තමන්ගේ මාළු සඳහා ඉතා අඩු මිලක් ලැබුණි. එදිනෙද ජීවත්වීම සඳහා මුදල් අවශ්‍ය බැවින් දුප්පත් ධීවරයින්ට තම මාළු කරවල බවට පත්කිරීමේ හැකියාවක්ද නොතිබිණි. අනෙක් අතට ඔවුන්ට කරවල සඳහාද වෙළඳපලක් නොතිබුණි. තත්ත්වය මෙසේ වුවත් දිවයිනේ අභ්‍යන්තරයට යත්ම මුහුදු මාළු නොලැබෙන ග්‍රාමීය ප්‍රදේශ වලින් මේ සඳහා මීට වඩා සතුටුදයක වෙළඳ පලක් සොයාගත හැකිය. මිරිදිය මාළු වඩාත් රසවත්ව පිසගත හැකි ක්‍රම පිළිබඳව සොයාබලා එවැනි ක්‍රම ජනතාව අතර ප්‍රචලිත කිරීමෙන් මිරිදිය මාළු සඳහා දැනට වඩා හොඳ වෙළඳපලක් අනාගතයේදී සපයා ගත හැකි වනු ඇත.

මිරිදිය ධීවර කර්මාන්තය දියුණු කිරීමේදී මුහුණ පෑමට සිදුවන සංස්කෘතික ගැටළු කෙරෙහි ද මෙහිදී අවධානය යොමු කිරීමට සිදුවේ. විශේෂයෙන්ම අවිහිංසාවාදය මුල් කර ගත් බුදු දහම අදහස වැඩි පිරිසකගෙන් යුත් ශ්‍රී ලංකාවේ ග්‍රාමීය සමාජය අතර මිරිදිය මත්ස්‍ය කර්මාන්තය වැන්නක් ප්‍රචලිත කිරීමේදී නොයෙක් අපහසුකම් ඇතිවේ. ජලාශයන්හි මසුන් මැරීමට මෙන්ම ගෘහ කර්මාන්තයක් වශයෙන් ටැංකි වල මසුන් ඇති කිරීම සඳහා බෞද්ධාගමිකයන් පොළඹවා ගැනීම ඉතා අසීරුය. මෙය මේ අංශය දියුණු කිරීමේදී බලපාන ප්‍රබල සාධකයකි.